MINISTRY OF EDUCATION

අධ්‍යාපන අමාත්‍යාංශය

G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper

අ.පො.ස. සාමාන්‍ය පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

GEOGRAPHY

භූගෝල විද්‍යාව

QUESTION PAPER - II

ප්‍රශ්න පත්‍රය - II

අනුග්‍රහය :

ICT BRANCH Ministry of Education Sri Lanka

NenasaTV

e තක්සලාව The National e-learning Portal for The General Education

අධ්‍යාපන අමාත්‍යාංශය

භූගෝල විද්‍යාව - II

අ.පො.ස. (සා/පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

11 ශ්‍රේණිය **කාලය - පැය 2 යි**

සැළකිය යුතුයි

- I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටස ව්‍යුහගත රචනා ප්‍රශ්න 07කින් සමන්විත වේ. ඉන් 04කට පිළිතුරු සැපයිය යුතුවේ.
- එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ලකුණු 40කි.

<u>I කොටස</u>

1) (අ) **ඔබ වෙත සපයා ඇති 1 : 50000 සිතියම් කොටස අධ්‍යනය කොට ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(i) සිතියමේ අංක 01, 02, 03 හා 04 යන ලක්ෂණ පහත පිළිතුරු අතරින් තෝරා අංක අනුව නැවත ලියන්න.

(රූළි බිම/හේන/වනාන්තරය/පාෂාණ උද්ගතය/සෙසු මාර්ගය/ ජීප් රථ මාර්ගය) (ල.02)

(ii) A-B හා C-D ලෙස දක්වා ඇති භූ ලක්ෂණ පහත පිළිතුරු අතරින් තෝරා අක්ෂර අනුව නම් කරන්න.

(උත්තල බෑවුම/අවතල බෑවුම/දළ බෑවුම/මොහොර බෑවුම) (ල.02)

(iii) මෙම සිතියම් ප්‍රදේශයේ දක්නට ලැබෙන වතු බෝග වගාවක් නම් කරන්න. (ල.01)

(iv) සිතියමේ ඊසාන කෙළවරට සම්බන්ධ J, K, L, M ලෙස දක්වා ඇති සිතියම් කොටසේ වර්ගඵලය වර්ග කිලෝමීටර්වලින් සොයන්න. (ල.02)

(v) සිතියමේ x හා y යන ලක්ෂ දෙකෙහි නිවැරදි පිහිටීම අක්ෂර අනුව වෙන වෙනම දක්වන්න. (ල.02)

- සිතියම් ප්‍රදේශය පිළිබඳ ප්‍රකාශ දෙකක් පහත දක්වා ඇත. එම ප්‍රකාශ නිවැරදි නම් “නි” යන්න වටා ද වැරදි නම් “වැ” යන්න වටා ද රවුමක් අඳින්න.

(vi) උතුරු මායිමට සම්බන්ධ ජලාශයේ මැදින් වැටී ඇත්තේ දිස්ත්‍රික් මායිමකි. (නි/ වැ)

(vii) උතුරු මායිමට සම්බන්ධ කොටුකර ඇති දුනුකෝවල නම් ප්‍රදේශයේ වී වගා බිම් හෙල්මළු ක්‍රමයට වගාකර ඇත. (නි /වැ)

(ල.02)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(i) සිතියමෙහි ලකුණු කොට ඇති A , B හා C යන ගංගා අතරින් "වොල්ගා" ගංගාව දැක්වෙන අක්ෂරය කුමක්ද?

(ii) සිතියමෙහි D , E හා F වලින් දක්වා ඇති කඳුවැටි අතරින් "ඇන්දීස්" කඳුවැටිය දැක්වෙන අක්ෂරය කුමක්ද?

(iii) සිතියමෙහි G , H හා J යන ගංගා නිම්න අතරින් වී වගාවට වැදගත් ප්‍රදේශයක් වූ "මිසිසිපි" ගංගා නිම්නය දැක්වෙන අක්ෂරය කුමක්ද?

(iv) සිතියමේ K, L, හා M වලින් දක්වා ඇති ප්‍රදේශ අතරින් "විලිවිලිස්" නමින් හැඳින්වෙන වාසුළි බල පැවැත්වෙන ප්‍රදේශය දැක්වෙන අක්ෂරය කුමක්ද?

(v) සිතියමේ P ,Q හා R අක්ෂරවලින් දැක්වෙන රටවල් අතරින් මෝටර්රථ කර්මාන්තයට ප්‍රමුඛත්වයක් දක්වන "දකුණු කොරියාව" දැක්වෙන අක්ෂරය කුමක්ද?

(ල.05)

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියම හොඳින් අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(i) සිතියමේ A , B හා C වලින් දක්වා ඇති ස්ථාන අතරින් ''මීගමුව කලපුව'' දැක්වෙන අක්ෂරය කුමක්ද?

(ii) සිතියමේ D , E හා F වලින් දක්වා ඇති දිස්ත්‍රික්ක අතරින් ''හෙනරත්ගොඩ උද්‍යානය'' දැක්වෙන අක්ෂරය කුමක්ද?

(iii) සිතියමෙහි G , H හා J යන ගංගා අතරින් ''ගල්ඔය'' දැක්වෙන අක්ෂරය කුමක්ද?

(iv) සිතියමෙහි K, L, හා M යන ස්ථාන අතරින් ''තලාතු මිනිරන්'' ඛනිජ නිධි පිහිටා ඇති ස්ථානයක් වූ ''තලාතුඔය'' දැක්වෙන අක්ෂරය කුමක්ද?

(v) සිතියමේ P ,Q හා R යන ජාතික උද්‍යාන අතරින් ''බූන්දල'' දැක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද?

(ල.05)

II කොටස

2) (i) පෘථිවි ව්‍යුහය අනුව ශිලා ගෝලය බෙදා දැක්විය හැකි කොටස් දෙක නම් කරන්න. (ල.02)

(ii) ජෛව ගෝලයේ සීමාවන් ලියා දක්වන්න. (ල.03)

(iii) වර්තමානයේ මිනිස් ක්‍රියාකාරකම්වල බලපෑම නිසා ජලයේ ගුණාත්මකභාවය අඩු වේ. නිදසුන් 02ක් ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)

3)



(i) ඉහත සිතියමේ A හා B වලින් දැක්වෙන ලෝකයේ කිරිපට්ටි පාලනය කරන ප්‍රදේශ 02ක් නම් කරන්න. (ල.02)

(ii) ලෝකයේ කිරිපට්ටි පාලනයේ විශේෂ ලක්ෂණ 03ක් නම් කරන්න. (ල.03)

(iii) (a) ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයේ ප්‍රධාන කොටස් 03කි. ඉන් 02ක් නම් කරන්න. (ල.01)

(iv) (b) ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය නගා සිටුවීමට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග 02ක් කෙටියෙන් විස්තර කරන්න. (ල.04)

4) (i) විද්‍යුත් නිෂ්පාදන කර්මාන්ත සඳහා ප්‍රචලිත

(a) නැගෙනහිර ආසියානු රටවල් 01ක් ද

(b) යුරෝපා රටවල් 01ක් ද නම් කරන්න. (ල.02)

(ii) විද්‍යුත් නිෂ්පාදන කර්මාන්ත ලෝකය පුරා වේගයෙන් ව්‍යාප්ත වීමට හා දියුණු වීමට හේතුවන කරුණු 3ක් දක්වන්න. (ල.03)

(iii) මෝටර් රථ කර්මාන්තයේ නව ප්‍රවණතා 02ක් විස්තර කරන්න. (ල.05)

5) (i) "ඛණිජයක්" යන්න අර්ථ දක්වන්න. (ල.02)

(ii) ශ්‍රී ලංකාවේ පහත ඛණිජ වර්ග ව්‍යාප්තව ඇති ප්‍රදේශ එක බැගින් නම් කරන්න.

A - සිලිකා වැලි

B - ඇපටයිට්

C - මිනිරන් (ල.03)

(iii) a. ශ්‍රී ලංකාවේ ඛණිජ සම්පත් වන මැණික් හා කෙඔලින් පදනම් කරගෙන කරනු ලබන ප්‍රධාන නිෂ්පාදන කර්මාන්ත 02ක් නම් කරන්න.

මැණික්

කෙඔලින් (ල.01)

b. පෙට්‍රෝ රසායන කර්මාන්තයේ නව ප්‍රවණතා දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.04)

6) (i) රටක සංවර්ධනය මැනීම සඳහා යොදා ගන්නා නූතන මිනුම් දෙකක් නම් කරන්න. (ල.02)

(ii) "මානව සම්පත් සංවර්ධනය" උදෙසා ගතයුතු ක්‍රියාමාර්ග 03ක් සඳහන් කරන්න. (ල.03)

(iii) වර්තමානය වන විට ලෝක ප්‍රජාවට "තිරසාර සංවර්ධනයක" අවශ්‍යතාවය දැඩිව පවතී. එසේ පැවසීමට හේතු වූ කරුණු 02ක් විස්තර කරන්න. (ල.05)

7) (i) ජන සංඛ්‍යාව පිළිබඳ සැලකීමේ දී ප්‍රධාන වශයෙන් වැදගත් වන ක්ෂේත්‍ර 02ක් හඳුනාගත හැකි ය. එම ක්ෂේත්‍ර 02 නම් කරන්න. (ල.02)

(ii) a. "ජන සංඛ්‍යා ස්පෝටනය" යනු කුමක් ද?

b. ලෝක ජන සංඛ්‍යාවේ වර්ධනය පිළිබඳ ඓතිහාසික දත්ත පිරික්සීමේ දී ජන සංඛ්‍යා වර්ධනයේ කැපී පෙනෙන අවධී 02ක් හඳුනා ගත හැකිය.එම අවධි 02 ලියන්න. (ල.03)

(iii)ශ්‍රී ලංකා ජන සංඛ්‍යා ව්‍යාප්තියේ ඇති අසමතුලිතභාවය අවම කිරීම සඳහා අනුගමනය කළ හැකි සාර්ථක ක්‍රියාමාර්ග 02ක් කෙටියෙන් විස්තර කරන්න. (ල.04)

8) (i) ජීව විද්‍යාත්මක උපද්‍රවයක් හා දේශගුණික උපද්‍රවයක් නම් කරන්න. (ල.02)

(ii) පහත සඳහන් මහද්වීපවල පිහිටි එක් ගිනි කන්ද බැගින් නම් කරන්න.

A - උතුරු ඇමෙරිකාව

B - යුරෝපය

C - අප්‍රිකාව (ල.03)

(iii) ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ වැඩපිළිවෙළ කරුණු 03ක් ඇසුරෙන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)